## පැරණි පුවත්පත් මතකයන්

# එලොව ගොස් මෙලොව ආ මාධ්‍ය වේදියා

සුදු දුමාරයක්, සුදු වළාකුලක් මගේ සිරුරෙන් නැගී ඉහළ අහසට විහිදීයනු මට පෙනිණි.

සියලු වේදනා දුරු විය. මහා සැහැල්ලුවක් සිතට ගතට දැනිණි. සුදු දුමාරය සමග මාත් ඉහළ අහසට ඇදිණ.

මුළු අහස පුරා ම සුද වැතිරිණි. සුදු පුළුන් වලා කැටි හැමතැනම. මිනිස් රූප රැසක් වළා කැටි අතරින් මතු විය. මුහුණු සහිත උඩුකය පමණි. ඒ මිනිස් රූප අතරින් මම සැහැල්ලු චාරිකාවක යෙදුණෙමි. සුදු දුමාරය ද මා සමඟ විය.

එක් තැනක හුරු පුරුදු මුහුණකි.
හිටපු ඇමතිවරයෙකු වූ ටී.බී. ඉලංගරත්නයන් ගේ මුහුණය ඒ.

ඔහු අසල කුඩා දරුවෙක් ද විය.
යළි වලා කැටි අතරින් එබී බලන මිනිස්සු.
මම ඔවුන් අතර, ඔවුන් සමඟ අහස පුරා සැරි සරමින් සිටියෙමි.

සුදු දුමාරය සමඟ දවසක් තිස්සේ මා පාවී ගිය ද මාගේ සිරුර තිබුණේ නවලෝක රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ඇඳක යන්ත්‍ර මැද ය. මා වලා කැටි අතර සිටිය දී, නවලෝක රෝහලේ දී හෘද රෝග විශේෂඥ වෛද්‍ය වසන්ත හෙට්ටිආරච්චි, කායික වෛද්‍ය චන්දිම ද මැල් මහත්වරුන් සමග වෛද්‍ය දැඩි සත්කාර ඒකකයේ සියලු වෛද්‍යවරු හා හෙද කාර්ය මණ්ඩලය මගේ සිරුරෙන් පලා ගිය ප්‍රාණය යළි සිරුරට කැඳවීමට මහත් වැර වෑයමක් දැරූහ.

හෘද ස්පන්දනය නතර වී මා සිටියේ මළවුන් ගේ ලෝකයක ය.

හෘදය යළි ක්‍රියාත්මක වූ පසු මම මගේ පරණ පුරුදු ලෝකයට පැමිණියෙමි. එහෙත් එයින් පසු ද පැය කීපයක් යන තුරු මට සිහිය ලැබුණේ නැත.

වලා කැටි අතර පා වෙද්දී මා ලැබූ සැහැල්ලු සුවදායක ප්‍රීතිය අතුරුදන්ව මට මහත් කායික වේදනාවක් දැනෙන්නට විය. කටුක සීතලක් මා වෙළා ගත්තේය. මම අත පය සෙලවීමට වෑයම් කෙළෙමි. වෑයම මන්දක් සරු විය. අපසහසුවෙන් ඇසි පිය ගැසූවෙමි. ලොව ම කැරකෙනු මට දැනිණ. යළි ඇස පියා ගතිමි.

මඳ වේලාවකට පසු මම යළි ඇසි පිය සොලවා දෑස් පියවෙන්නට නොදී බලා සිටියෙමි.

බොඳ වූ රුවක් මා ඉදිරියේ පෙනිණි. ඒ රුව මඳක් පැහැදිලි විය. ඇය හෙදියකි. දැඩි විමසිල්ලෙන් ඇගේ දෑස මා දෙසට යොමු වී තිබිණි.

මම තොල් සෙලවූයෙමි.
"වේලාව කීයදැ" යි ඇසීමි. ඇයට මගේ වචන පැහැදිලි නොවී ය. මම අත ඔසවා වෙලාව කීයදැයි යළි ඇසීමි. මගේ සංඥාව ඇයට වැටහිණ.
"වෙලාව තුනයි පහයි"
"හවසද?"
"ඔව්, හවස"
"අද කවදද?"
"අද 24 වැනිදා බ්‍රහස්පතින්දා"
මගේ මතකය ක්‍රමයෙන් පිබිදිණි.
2000 පෙබරවාරි 23 වැනිදා හවස හතරේ සිට 24 වැනිදා හවස 3.05 දක්වා මා පසුවූයේ මළවුන් ගේ ලොවක ය.

23 වැනිදා සවස 3.05 ට මගේ පුතා සමඟ මා කතා කරමින් සිටියා හොදට මතක ය. මා සිටියේ නවලෝකයේ දැඩි සත්කාර ඒකකයේ යන්ත්‍ර සමඟ ය. මගේ පණ රැක දුන් ඒ උතුම් යන්ත්‍රය මගෙන් ගලවා මා අසලම තිබිණි.

වෛද්‍යවරු හෙදියෝ මා අසලට පැමිණ මට සුබ පැතූහ.

මට කතාව තහනම් විය.
මගේ පත්තර සඟයෝ, නෑදෑ මිතුරෝ මට පෙනි පෙනී මා ළඟින් එහාට මෙහාට ගියහ. මගේ දෑසට කඳුළු නැගිණි. ඔබ සමඟ යළි ජීවත් වීමට ඔබට ආදරය නිසාම යළි ආවෙමි. මට සිතිණ.

මා හෘදයාබාධයකට ලක්ව රෝහලට පැමිණි මොහොතේ සිට මා වෙනුවෙන් බෝධි පූජා, දේව යාතිකා පැවැත්වූ මගේ මිතුරන් නෑයන් මම අපරිමිත ස්නේහයෙන් වැළඳ ගතිමි. සිතුවම් පටක් මෙන් මට ඒ සිදුවීම් මැවී මැවී පෙනිණ.

සිළුමිණ පුවත්පතේ සේවය කරන මා 23 වැනිදා උදෑසන ම ලේක්හවුසියට ආවේ මහනුවර පල්ලෙකැලේ රණවිරු නිවෙසක් බැලීමට පුවත්පත වෙනුවෙන් යන අදහසිනි. මා එන විට මා සමඟ යාමට සිටි පිරිස පිටත් වී ගොස් තිබිණි. මම කාර්යාලයේ නතර වූයෙමි. බම්බලපිටියේ මිනින්දෝරු සංගම් කාර්යාලයේ පුවත්පත් සාකච්ඡාවක් ද එදා උදේ වරුවේ තිබිණි. මම ඒ සඳහා ගියෙමි. බසයෙන් බැස මිනින්දෝරු කාර්යාලය දෙසට ගමන් කල මට බඩේ වේදනාවක් දැනිණ. ඇවිදීම අපහසු විය. මම නතර වූයෙමි. යළි ගමන් කළෙමි.

මිනින්දෝරු සංගමයේ සාකච්ඡාව ඇරඹී තිබිණි. මම පුටුවක හිඳ ගනිමින් පමාව ගැන සමාව ඉල්ලුයෙමි. වතුර වීදුරුවක් බිව්වෙමි. කෙක් කෑල්ලක් ද කෑවෙමි. බඩේ රිදුම අඩු විය. සාකච්ඡාවෙන් පසු මම ලේක්හවුසියට එන්නට පිටත් වීමි. අඩි හත අටක් එන විට මට යළි බඩේ රිදුම දැනිණි. බඩේ සිට පපුව දෙසට ඒ රිදුම විහිදිණි. මම නතර වී සිටියෙමි. රිදුම අඩු විය. අසල වූ තේ කඩයකින් තේ පානය කළ පසු මට හොඳ සුවයක් දැනිණ.

වේලාව දහවල් දොළහ පසු වී තිබිණි. ඇස් වාට්ටුව හන්දිය පසු කරමින් සිටි මට වෛද්‍යවරයෙකු හමුවීමට ඇත්නම් හොඳයි සිතිණි. බසයෙන් බැස සෞඛ්‍ය අමාත්‍යාංශයට ගියෙමි. පෞද්ගලික රෝහල් බාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා හමුවීමි. එතුමා මා හෘද රෝග විශේෂඥ වෛද්‍ය වජිර සේනාරත්න මහතාට යොමු කළේ ය.

මම විටින් විට දැනුණ වේදනාව ගැන එතුමාට කීවෙමි.

මා පරීක්ෂා කරවා ඊ. සී. ජී වාර්තාවක් ද ලබා ගත් එතුමා වාර්තාවේ නරක තත්ත්වයක් නොපෙනෙන බව කීය.

"අමාරුවක් දැනුනොත් එන්න"
වජිර මහතා මට බෙත් වර්ග කීපයක් ද දුන්නේ ය.

ලේක්හවුසියට පැමිණි මම මිනින්දෝරු සංගම් කාර්යාලයේ පැවති සාකච්ඡාව පිළිබඳ ලිවීමට සැරසුණෙමි. මට යළිත් බඩේ වේදනාව දැනිණි. මම වජිර මහතා දුන් බෙත් පෙත්තක් දිව යට තබා ගතිමි. වේදනාව අඩු විය.

යළි වේදනාව මතුවිය. තවත් බෙත් පෙත්තක් දිව යට තබා ගතිමි. සිළුමිණේ මිතුරන් කීප දෙනෙකු සිටියද මම මේ තත්වය නොකීවෙමි. වේදනාව අඩු විය.

පස්වරු 3.05 ට පමණ මම නිවසට දුරකථනයෙන් කතා කළෙමි. "දුවත් පුතාත් ඇවිල්ලා දැයි" ඇසීමි.
යළි වේදනාව නැගිණි.

මට මගේ බිරිඳ කමනී සිහිවිය. ඇය සේවය කරන්නේ 'දිනමිණ' කර්තෘ මණ්ඩලයේ ය. මම ඇය හමුවීමට යාමට සිතුවෙමි. මගේ දෙපා අප්‍රාණික වනු දැනිණි. අපහසුවෙන් ඇවිද ගියෙමි.

මග දී මා සිළුමිණ කර්තෘ සුජීව දිසානායක මහතා ගේ කාමරයට ගොස් 'මට අසනීපයි' කිමට සිතිණි. එහෙත් ඒ සඳහා මට ශක්තියක් නැත. මම කමනි ළඟට ගියෙමි. ඇගේ අසුනේ හිඳ ගතිමි.

මා එතනට ගියේ මහත් අපහසුවෙන්. මට "කමනි දකින්නට ලැබුණොත් ඇති..." මඟ දී සිතිණි. මගේ මරණය අත ළඟටම ඇවිත්, මම ඇය දුටුවෙමි. සිතට සහනයක් දැනිණි.

මගේ අමුත්තක් ඇයට දැනිණි.
"ඔයාට මොකද? සනීප නැහැනේද?" ඇය ඇසුවාය.
ඇගේ බෝතලය ගෙන වතුර බීගෙන බීගෙන ගියෙමි. මට උදේ සිට සිදුවූ දේ මම ඇයට කීවෙමි.

"දැනුත් අමාරු ද?"
"දැන් මට මොකක්දෝ වේගෙන එනවා. මා වහා රෝහලට ගෙන යන්න. බය වෙන්න එපා."
"දැන් මහ රෝහලේ වෛද්‍යවරුන් පෞද්ගලික රෝහල් වලට ගිහිල්ලා. අපි නවලෝකෙට යමු."

ඇගේ මතයට මම ද එකඟ වීමි.
මගේ පත්තර මිතුරෝ මා වටා රැස් වුහ. ලේක්හවුසියේ රියකින් මා නවලෝක රෝහලට ගෙන යනු ලැබිණ. ඊට පෙර මාගේ අසනීප තත්ත්වය නවලෝක රෝහලේ වෙළඳ කළමනාකරු විතානගේ මහතාට දිනමිණ කර්තෘ මණ්ඩලයේ එම්. ඩී. ධර්මසිරි මහතා විසින් දන්වා තිබිණි. විතාන මහතා මගේ ද මිත්‍රයෙකි.

ඊ.සී.ජී පරීක්ෂණයකට මම ලක්වීමි. මගේ තත්වය අභයපත් බව පෙනිණ.
ඒ අවස්ථාවේ මා ඇතුළු කිරීමට කාමරයක් හිස්ව නොතිබිණි.

වෛද්‍ය දැඩි සත්කාර ඒකකයේ එක් ඇඳක් පමණක් හිස්ව ඇති හෙයින් මා එහි තැබීමට විතානගේ මහතා ඉල්ලීමක් කලේය.
මට ඒ ඇඳ ලැබිණි.

මා ඒ ඇඳ මත තැබීමත් සමඟම මට අමුත්තක් දැනිණි.

මුළු ඇඟම ඇඹරී යනු දැනිණි. ඉන්පසු මට සිදුවූයේ කුමක් ද?
සුදු දුමක් සමඟ අහසේ පාවෙන්නට වූයේ ඉන් පසුවය.

ඉන්පසු මට කීමට ඇත්තේ මා ඇසූ පුවත්ය. මගේ හෘද ක්‍රියාකාරීත්වය ඇණ හිටියේ ය. වෛද්‍යවරු යළි හෘදය ක්‍රියාකාරීත්වය ලබා දීමට 'ඉලැක්ට්‍රික් ෂොක් ' දුන්හ. හද පණ ගැන්වීමට අතින් 'මසාජ්' කිරීම පටන් ගත්හ. ෂොක් ට්‍රීට්මන්ට් දෙන්නේ වාර පහක් පමණි. යළි පණ නොලැබුණහොත් එය නතර කරනු ලැබේ. එහෙත් මෙහිදී මට මේ වෛද්‍යවරු විසි අට වාරයක් ෂොක් ට්‍රීට්මන්ට් දී තිබේ. විසි නව වැනි වාරය ඇරඹීමට පෙර හෘදය ක්‍රියාත්මක විය. සාමාන්‍ය ඉලෙක්ට්‍රික් ෂොක් එකකට වෝල්ට් 230 කි. එහෙත් මට ලැබුණේ වෝල්ට් 300 ඉලෙක්ට්‍රික් ෂොක් ය.

හුස්ම වැටීම ඇරඹීමත් සමඟම මගේ පණ රැක දීම හෘද ස්පන්දනය දිගටම පවත්වා ගැනීම යන්ත්‍රයකට බාර දී ඇත. ඒ යන්ත්‍රය මෙන් ම තවත් යන්ත්‍ර රැසක් මා රැක ගැනීමට මගේ ඇඳ වටා සවි කොට තිබිණි.
"ඒ ඇඳේ සිටිය දී ඔබ හෘදයාබාධයකට ගොදුරු වීම වාසනාවක්. තත්පර කීපයක් හෝ පමා වුණා නම් ඔබ ජීවත් කරන්නට ලැබෙන්නේ නැහැ."

වෛද්‍යවරයෙක් මට පසුව කීය.
මා 23 වැනිදා මහනුවර පල්ලෙකැලේ රණවිරු නිවාස වැඩ පිළිවෙල බැලීමට යාමෙන් වැළකුවේ කවුද? මහ රෝහලට යාම වළක්වා මා නවලෝකයට එවූයේ කවු ද? නවලෝක රෝහලේත් කාමරයකට නොයවා මා වෛද්‍ය දැඩි සත්කාර ඒකකයේ ඇඳක රැඳවූයේ කවු ද? මෙලොව තවදුරටත් ජීවත් වීමේ වාසනාව මට ලබාදීමට කිසියම් අද්භූත බලයක් විසින් මා හසුරුවන්නට ඇද්ද?

මම සිතන්නට වීමි.
මගේ මිතුරෙක් මෙසේ කීය.
"මා හඳුනාගත් දා පටන් ඔබ රෝගීන් සිය ගණනකට ජීවිතය ලබා දීමට වෙහෙසුන කෙනෙක්. 'දිවයින' පුවත්පතේ සේවය කළ යුගයේත්, ලේක්හවුසියේ ගත කළ යුගයේත් ඔබ පුවත්පත් කලාවේදීන්, ඔවුන්ගේ නෑ මිතුරන්, කී දෙනෙකු වෙනුවෙන් වෛද්‍යවරුන් හමුවන්නට ඇද්ද?

ඔබ ඔබේ අතින් මුදල් ද වැය කරමින් ඔවුන්ට බෙත් ලබා දෙන්න රැස් කළ පින් මෙලොව වශයෙන් විපාක දීමක් ලෙසයි මා මේ අද්භූත බලය හඳුනාගන්නේ. ඔබ නවලෝක රෝහලේ සිහිසුන්ව ගෙවූ දවසේ ලංකාවේ ප්‍රදේශ කීපයක ම ඔබ වෙනුවෙන් බෝධි පූජා දේව යාතිකා පැවැත්වීමට ඔබේ මිතුරන් ඉදිරිපත් වුණා. ඒ සියල්ල මෙන්ම කැපවුණු මානව ප්‍රේමී වෛද්‍යවරු, හෙදියන් පිරිසක් ඔබ රැක ගැනීමට ඉදිරිපත් වුණා."

මම කඳුළු හෙළමින් මිතුරු බසට කන් දී සිටියෙමි.

මගේ භාර්යාව ආදරණීය කමනි වහා ක්‍රියාත්මක වී මා නවලෝක රෝහලට ගෙන ගිය හැටි මට සිහිවේ.

එහෙත් මරණයට මගේ බියක් නම් නොවීය. මගේ අර මිතුරා කී ලෙස මට මගේ ජීවිතය දෙස ආපසු හැරී බලා සතුටු විය හැකි හෙයිනි.

**සුනිල් දයා අල්විස්**
සිළුමිණ 2000 ජුලි 23